<u>කහවත්ත ප්‍රාදේශීය සභාව</u>

<u>රත්නපුර දිස්ත්‍රික්කය</u>

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 පෙබරවාරි 27 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 ජනවාරි 31 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූනි 22 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය
-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්බව හේතුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට කහවත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා ලබාගත් රු. 13,800,000 ක්වූ ණය මුදල, ආපසු ගෙවිය යුතු ණය මුදලක් වශයෙන් ගිණුම්ගත කරනු වෙනුවට ප්‍රාග්ධන ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) දේශීය ණය හා සංවර්ධන අරමුදලේ සනාථ කිරීම් අනුව වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා ලබාගත් ණය මුදලට අදාලව සමාලෝචිත වර්ෂය සඳහා වන පොළී ප්‍රමාණය රු. 790,800 ක් වුවද, සමාලෝචිත වර්ෂයේදී රු. 986,750 ක් වැය ශීර්ෂයට ගලපා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ වියදම රු. 195,950 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභා වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා පෞද්ගලික ආයතනයක් සමඟ 2013 වර්ෂයේදී එළඹ තිබූ ගිවිසුම් ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානයට තවදුරටත් ගෙවීමට ඇති මුදල රු. 5,840,784 ක් විය. ගෙවීමට ඇති කොටස් මුදල් වශයෙන් ණයහිමියන් සඳහා රු. 6,829,830

ක් වෙන්කර තිබූ අතර, තවදුරටත් රු. 11,000,000 ක් කිසිඳු නිශ්චිත පදනමකින් හෝ ගිවිසුම් ගතවීමකින් තොරව ණයහිමියන් සඳහා වෙන්කිරීම් සිදුකර තිබුණි. .

(ඈ) සමාලෝචිත වර්ෂයේදී මිලදීගත් රු. 220,450 ක් වටිනාකමැති ස්ථාවර වත්කම් ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග වශයෙන් ලද රු. 13,045,000 ක් වටිනාකමැති වත්කම් පරිත්‍යාග සංචිත වශයෙන් ගිණුම්ගත කිරීම වෙනුවට ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමට ගිණුම්ගත කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයට අදාල විගණන ගාස්තු රු. 58,501 ක් ණයහිමියන් සඳහා වෙන්කර වර්ෂයේ වියදමට ගලපා නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ උසාවි දඩ හිඟ ආදායම් රු. 5,310,416 ක් වුවද, උසාවි දඩ ලෙජර් ගිණුම අනුව එම ශේෂය රු. 4,367,932 ක් වූයෙන් රු. 942,484 ක වෙනසක් විය. සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා උසාවි දඩ ආදායම් ලෙස රු. 2,076,625 ක් හඳුනාගෙන තිබියදී වර්ෂයේ ආදායම් වශයෙන් අයවැයගත ඇස්තමේන්තු ආදායම වූ රු. 4,000,000 ක් ගිණුම්ගත කර තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ මුද්දර ගාස්තු හිඟ ආදායම් රු. 2,706,940 ක් ලෙස හඳුනාගෙන තිබුණද, ලෙජර් ගිණුම අනුව ආරම්භක ශේෂය රු. 1,637,080 ක් වූයෙන් නිසි පරිදි හිඟ ආදායම ගිණුම්ගත කර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය නිර්දේශ කරන ලද රු. 18,834 ක් වටිනාකමින් යුත් ද්‍රව්‍ය බැහැර කිරීමට හෝ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුමත කිරීමට ප්‍රථම ගිණුම් මඟින් ඉවත් කර තිබුණි.

(ඒ) ඉදිරි වර්ෂය වෙනුවෙන් ලැබූ වරිපනම් බදු රු. 160,510 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

## 1.3.2 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව. | අනුකූල නොවීම්. |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| (I) | 132 (ඒ) වගන්තිය | ප්‍රජා පිළිගැනීම හෝ පොදු වැදගත් කටයුත්තක් හෝ සිද්ධියක් හෝ අවස්ථාවක් පිළිබඳව හෝ වියදම් සඳහා එක් වර්ෂයකට මුළු එකතුව රු. 1,000 ඉක්මවන වියදම් සඳහා අමාත්‍යවරයාගේ ලියවිල්ලකින් පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවත්, ඊට පටහැනිව අවස්ථා 04 කදී එකතුව රු. 40,300 ක වියදමක් දරා තිබුණි. |
| (II) | 132 (ඔ) වගන්තිය | පුණ්‍ය හෝ සුභසාධන ආයතන වලට ආධාර පිණිස එක් වර්ෂයකට මුළු එකතුව රු. 1,000 ඉක්මවන වියදම් සඳහා ලියවිල්ලකින් අමාත්‍යාවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව වියදම් දැරිය යුතු වුවද, ඒ පිළිබඳව නොසලකා අමාත්‍යවරයාගේ අනුමැතිය රහිතව වර්ෂය තුලදී ආගමික ස්ථාන වල සංවර්ධන කටයුතු සඳහා අවස්ථා 04 කට අදාලව රු. 140,000 ක වියදම් සහා අරමුදලින් දරා තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (I) | මුදල් රෙගුලාසි අංක 101 සිට 110 දක්වා | 2013 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව ඌණතාවයක් ලෙස දක්වා තිබූ ප්‍රධාන කාර්යාලයේ අංක 46-4075 දරන ට්‍රැක්ටර් ටේලරය සහ අනතුරට ලක්වූ ඩබල් කැබ් රථය සම්බන්ධයෙන් විගණිත අවස්ථාව වූ 2015 පෙබරවාරි මස වනවිටත් යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (II) | මුදල් රෙගුලාසි අංක 371 | 2006 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා අවස්ථා 14 කදී ලබා දී තිබූ එකතුව රු. 119,149 ක්වූ අත්තිකාරම් 2015 පෙබරවාරි මාසය වන තුරුම පියවීමට කටයුතු කර නොතිබුණි. |
| (III) | මුදල් රෙගුලාසි අංක 571 | 1981 වර්ෂයේ සිට ඉදිරියට ගෙනඑනු ලබන රු. 1,252,003 ක්වූ තැන්පතු ශේෂ 136 ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | නාගරික සංවර්ධන හා පූජාභූමි අමාත්‍යාංශ ලේකම්ගේ 2009 අප්‍රේල් 17 වන දිනැති අංක 1597/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි V වන උපලේඛණය | සභා බල ප්‍රදේශය තුල පවතින දුරකථන සම්ප්‍රේෂණ කුළුණු සම්බන්ධයෙන් නිසි සමීක්ෂණයක් සිදුකර නියමිත ගාස්තු අයකල යුතු වුවත්, 2015 පෙබරවාරි මාසය වනවිටත් එසේ සිදුකර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 3,005,086 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 3,199,287 ක් විය.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය මෙහෙයුම් අතිරික්තය රු. 194,201 කින් අඩුවී තිබූ අතර, එය සියයට 6 ක අඩුවීමක් විය. පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් වල වැඩිවීම මෙයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

-----------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

--------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| ------------------ | ------------------- | ------ | ----------------------- |
| | රු. '000' | රු. '000' | රු. '000' |
| වරිපනම් හා බදු | 2,523 | 2,690 | 2,712 |
| බදු කුලී | 4,310 | 3,099 | 692 |
| බලපත්‍ර ගාස්තු | 1,026 | 756 | - |
| වෙනත් ආදායම් | 9,657 | 9,772 | 4,888 |

2.3.2 වරිපනම් බදු

-----------------

2014 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු වටිනාකම රු. 2,408,386 ක් වූ අතර, ඉන් සියයට 93 ක් වර්ෂයකට වඩා වැඩි කාලයක සිට හිඟව පවතින ශේෂයක් විය.

2.3.3 බදු කුලී

----------

පළාත් පාලන කොමසාරිස්ගේ 2009 මාර්තු 09 දිනැති අංක ප.පා.කො. 2009/01 දරන චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව මස් හා මාළු වෙළඳසැල් වාර්ෂිකව බදුදීමට පියවර ගතයුතු අතර, පෙර වර්ෂයේදී කඩය බදුදුන් මුදල ඊළඟ වර්ෂයේ අවම ලංසුව ලෙස සලකා බදුදීම සඳහා ටෙන්ඩර් කල යුතු විය. කහවත්ත පොදු වෙළඳසැල ගවමස් කඩය සඳහා 2009 හා 2010 වර්ෂ සඳහා ටෙන්ඩර් මුදල පිළිවෙලින් රු. 903,000 ක් සහ රු. 905,000 ක්ව තිබුණද, පළාත් පාලන කොමසාරිස්ගේ 2011 පෙබරවාරි 09 දිනැති අංක CLG 611 දරන ලිපිය අනුව රු. 500,000 කට එම ඉල්ලුම්කරුටම ලබා දීමට තීරණය කර තිබුණි. ඒ අනුව 2012 වර්ෂයේ සිට 2014 දක්වා

පිළිවෙලින් රු. 513,000 ක්, රු. 515,000 ක් හා රු. 519,000 ක් වශයෙන් අඩු වටිනාකම් මත එකම පුද්ගලයෙකුට ටෙන්ඩරය ලබා දී තිබුණි. එබැවින් ටෙන්ඩරය නිසි තරඟකාරීත්වයකට ලක්කර සභාවට ලබාගත හැකි උපරිම වාසියක් ලබා ගැනීම සඳහා කටයුතු කල බවට අනාවරණය නොවුණි.

2.3.4 වෙනත් ආදායම්

-------------------

සභා බල ප්‍රදේශයේ ප්‍රදර්ශිත දැන්වීම් පුවරු හා ත්‍රීරෝද රථ ගාල් මඟින් ආදායම් උත්පාදනය කර ගැනීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ඒ අනුව බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා ලැබිය යුතු රු. 1,827,875 ක උසාවි දඩ මුදල් අයවී නොතිබූ අතර, 2014 ඔක්තෝබර් සිට 2014 දෙසැම්බර් දක්වා ලැබිය යුතු උසාවි දඩ මුදල් ප්‍රමාණය හඳුනාගෙන නිශ්චය කර ගැනීමට කිසිඳු පියවරක් ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා මුද්දර ගාස්තු වශයෙන් කිසිඳු මුදලක් ලැබී නොතිබූ අතර, ඒ සම්බන්ධයෙන් විමසීම් කර සභාවට අයවිය යුතු මුදල් ලබා ගැනීම සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

2.3.6 කර්මාන්ත බදු හා ව්‍යාපාර බදු

----------------------------------

සභා බල ප්‍රදේශය තුල ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු සම්බන්ධයෙන් ප්‍රමාණවත් සමීක්ෂණයක් සිදුකර නොතිබූ අතර, සමීක්ෂණය සිදුකර තිබූ ආයතන සම්බන්ධයෙන්ද නියමිත ආකෘතීන් භාවිතා කර නිසිපරිදි තොරතුරු ලබාගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

3.1.1 විදේශ ගමන් වියදම්

---------------------------

2014 නොවැම්බර් 10 දින සිට 2014 නොවැම්බර් 15 දින දක්වා ප්‍රාදේශීය සභාවේ සභිකයින් 04 දෙනෙකු සහභාගී වී තිබූ පෞද්ගලික ආයතනයක් විසින් සංවිධානය කරන ලද දින 05 ක විදේශ සංචාරය සඳහා සභිකයෙකුට රු. 98,200 ක් බැගින් රු. 392,800 ක මුදලක් පෞද්ගලික ආයතනයක් වෙත සභා අරමුදලින් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

I. විදේශගත වීමට පෙර අදාල නිවාඩු අනුමත කර නොතිබුණි.

II. පුහුණු වැඩසටහන විගණනයට ඉදිරිපත් නොවුණි.

III. පුහුණුව මඟින් ලබාගත් දැනුම දේශීය වශයෙන් උපයෝගී කරගන්නා ආකාරය පිළිබඳව වාර්තාවක් පුහුණුව අවසන් වී මාසයක් ඇතුලත ඉදිරිපත් කර නොතිබුණි.

IV. පළාත් පාලන ආයතන ප්‍රධානියෙකු හෝ නියෝජ්‍ය ප්‍රධානියෙකු හෝ සභිකයෙකු විදේශ පුහුණු වැඩසටහන් සඳහා තෝරා ගන්නේ නම් අදාල සංවිධානය හෝ විදේශ රාජ්‍ය හෝ විදේශ ආයතනයන් ඒ සඳහා වැය වන සියළු වියදම් හා පහසුකම් දැරිය යුතු වුවත්, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම්ගේ 2010 සැප්තැම්බර් 09 දිනැති අංක PL/07/02/05/26 දරන චක්‍රලේඛයේ විධිවිධාන නොසලකා උක්ත ගෙවීම් කර තිබුණි.

V. සංචාරය වෙනුවෙන් අනියම් දීමනා වශයෙන් රු. 20,000 බැගින් වූ එකතුව රු. 80,000 ක අත්තිකාරම් මුදල් විදේශ ගමන සඳහා සහභාගී වූ සභිකයින් 04 දෙනා සඳහා ලබා දී තිබූ නමුත් 2015 පෙබරවාරි මාසයේ විගණන පරීක්ෂණ දිනය දක්වා අත්තිකාරම් මුදල් පියවා නොතිබුණි.

3.1.2 අවිධිමත් ගනුදෙනු

-------------------------

(අ) සමාලෝචිත වර්ෂයේදී රු. 835,707 ක් වටිනාකමැති පරිගණක යන්ත්‍ර 03 ක්, ප්‍රින්ටර් 03 ක්, විදුලි උපකරණ, පුස්තකාල සඳහා උපකරණ හා පුටු මේස මිලදී ගැනීමේදී 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4 වගන්තියේ විධිවිධාන අනුව නියමිත පිරිවිතර හෝ තාක්ෂණික ඇගයීම් කමිටුවක නිර්දේශ ලබාගෙන නොතිබුණි. මාර්ගෝප සංග්‍රහයේ 8.12.3 වගන්තියේ

නියමයන් අනුව පරිගණක හා ප්‍රින්ටර් මිලදී ගැනීමේදී එකී පරිගණක හා ප්‍රින්ටර් අදාල පිරිවිතරයන්ට අනුකූලව මිලදී ගත් බවට ඒ සම්බන්ධයෙන් දැනුමක් ඇති නිළධාරියෙකු විසින් සහතික කල යුතු වුවද, එසේ සිදු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් පෞද්ගලික වාහන සඳහා අවස්ථා 21 කදී රු. 337,300 ක කුළී ගෙවීම් සිදුකර තිබූ අතර, වාහන කුළී ගෙවීමේදී සිදු කරන ලද රාජකාරී, ගමන් කල දුර ප්‍රමාණය ගමන් පිළිබඳ විස්තර, විගණනයට ඉදිරිපත් නොවුණි. ඉහත වියදම් අතරින් රු. 210,000 ක් ගෙවීම සඳහා විෂයයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී තිබුණද, රු. 127,300 ක්වූ ඉතිරි ගෙවීම් සඳහා එවැනි අනුමැතියක් ලද බවට තොරතුරු අනාවරණය නොවුණි.

3.1.3 බලය නොලත් ගනුදෙනු

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අක්කර බදු රු. 2,363 ක්ද, වරිපනම් බදු රු. 37,712 ක්ද, වශයෙන් හිඟ ආදායම් රු. 40,075 ක් නිසි අනුමැතියක් ලබා ගැනීමකින් තොරව ජ'නල් සටහන් මඟින් කපාහැර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී පවත්වන ලද මුදල් හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම් වලට සහභාගී වූ ප්‍රාදේශීය සභා සභිකයින් හා නිළධාරීන් වෙනුවෙන් එකතුව රු. 45,500 ක්වූ දීමනා ගෙවා තිබූ අතර, ඒ සඳහා වූ නිසි අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොකෙරින.

3.1.4 ආර්ථික නොවූ ගනුදෙනු

--------------------------

ලියාපදිංචි අංක 49-9781 දරන ට්‍රැක්ටර් රථය අළුත්වැඩියාව සඳහා රු. 197,692 ක වියදමක් දරා තිබූ අතර, ගොඩකවෙල ඩිපෝ ඉංජිනේරු විසින් පරීක්ෂා කර අළුත්වැඩියාව සාර්ථකව සිදුකල බවට තහවුරු කර තිබුණි. මෙම අළුත්වැඩියාවෙන් අනතුරුව උක්ත ට්‍රැක්ටරය ධාවනය කල බවට ධාවන සටහන් මඟින් හෝ ලිපිගොනු මඟින් අනාවරණය නොවූ අතර, විගණිත දිනය වූ 2015 පෙබරවාරි 12 දින වනවිටත් එකී ට්‍රැක්ටරය ධාවන තත්තවයේ නොමැතිව අක්‍රීයව පැවතුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

(අ) ඇල්ලගෙවත්ත ආයුර්වේද බෙහෙත් ශාලාවේ බෙහෙත් ගබඩා කර තැබීම සඳහා ප්‍රමාණවත් සහ ක්‍රමානුකූලව පවත්වා ගෙනයනු ලැබූ ගබඩාවක් නොතිබුණි.

(ආ) ඇන්දාන ජල ව්‍යාපෘතිය සඳහා තාක්ෂණික ඇගයීමකින් හෝ නියමිත පිරිවිතරයන්ට අනුකූලව භාණ්ඩ මිලදී ගත් බවට සහතිකයකින් තොරව සමාලෝචිත වර්ෂය තුලදී රු. 400,320 ක් වටිනා ජලනල මිලදී ගෙන තිබුණි. ජල ව්‍යාපෘතිය වැඩිදියුණු කිරීමේ කටයුතු 2015 පෙබරවාරි මාසයේ විගණන පරීක්ෂණ අවස්ථාව වනවිටත් ආරම්භ කර නොතිබුණි. 2014 දෙසැම්බර් 31 දින වනවිට පාරිභෝගිකයින් 251 දෙනෙකුගෙන් රු. 169,741 ක හිඟ ජල ගාස්තු අයකර ගැනීමට තිබුණි.

(ඇ) 2014 ජනවාරි සිට 2014 දෙසැම්බර් දක්වා අංක LE 7471 දරන කැබ් රථය අදාල ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3.3 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

--------------------------------------

ප්‍රාදේශීය සභාවට ලැබී තිබූ අංක RD 7991 දරන ටිපර් රථය හා අංක RX 1985 දරන ගලිබවුසරය විගණිත දිනය වූ 2015 පෙබරවාරි 13 දින වනවිටත් ප්‍රයෝජනයට නොගෙන සභාවේ ගාල් කර තිබුණි.

3.4 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

පළාත් සභා අමාත්‍යාංශය ප්‍රතිපාදන යටතේ නැගෙනහිර නුගවෙල කරවිට මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය රු. 500,000 ක ඇස්තමේන්තුවක් මත රු. 493,415 ක ගිවිසුමකට එළඹ තිබූ අතර කර්මාන්තය සඳහා රු. 492,196 ක මුදලක් ගෙවා තිබුණි. කර්මාන්තයට අදාල මිනුම් පත්‍රය අනුව මාර්ගයේ කොන්ක්‍රීට් තට්ටුවේ උස අගල් 05 ක් විය යුතු වුවත්, 2015 පෙබරවාරි 19 දින සිදු කරන ලද ස්ථානීය පරීක්ෂාවේදී මාර්ගයේ අවසානයේ සිට මීටර් 40 ක් පමණ ආපසු දුරට ස්ථාන කිහිපයක මාර්ගයේ උස අගල් 04 ක් බව අනාවරණය විය.

3.5 සන අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල එකතුවන කසල කළමනාකරණය සම්බන්ධයෙන් නිසි වැඩපිළිවෙලක් නොවූ අතර, නගරයේ දෛනිකව එකතුවන කසල හවුපෙවත්ත ප්‍රදේශයේ විවෘත භූමියක හෝ වලවල් කපා පස් වලට යට කිරීම වැනි අනාරක්ෂිත ක්‍රම මඟින් කසල බැහැර කිරීම හේතුවෙන් ප්‍රදේශයේ ජනතාවගේ දැඩි විරෝධතා පැනනැගී තිබුණි. එසේ කසල බැහැර කිරීම සඳහා වලවල් කැපීම වෙනුවෙන් වර්ෂය තුලදී එකතුව රු. 140,990 ක වියදම් දරා තිබුණි.

4. පද්ධති හා පාලන

-----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඊ) සන අපද්‍රව්‍ය කළමනාකරණය